

# පිරිසිදු කරමු අපි අපගේ පරිසරය

01. පිරිසිදු නොවුන තැන දුගඳට    හිතකරය
එය මැසි මදුරු බිහි කරවන    සුරපුරය
රටකට රෝග බිය ගෙන එන    උවදුරය
අප රැක ගත යුතුය අපගේ    පරිසරය

02. මිදුලයි ගෙයයි නිතරම පිරිසිදුව    තියා
කැත කුණු ගෙවත්තේ හැම තැනකටම    නොයා
රොඩු කැළි කසළ නොතබා හැමවිටම    සොයා
පිරිසිදු කරමු යුතුකම් ඉටු කරන    නියා

03. නිවසේ තිබෙන කුණු ටික උදයේ    නැගිට
පොලිතින් බෑගයක පුරවා ගෙන    හොඳට
මහ පාරට දමයි විමසීමක්    නොකොට
නීතිය අනුව වරදකි පවසමි    ඔබට

04. නිතරම මැයි මදුරු උවදුර මතු    වෙන්නේ
පවුලේ සිටින අය ලෙඩවී    වැළපෙන්නේ
බෝවෙන වසංගත රටටම    පැතිරෙන්නේ
පරිසරයේ වැරැද්දෙන් බව    පිළිගන්නේ

05. ඇත්නම් අපිරිසිදු දේවල් සියලු    තැන
පැතිරෙයි දුගඳ රෝ බිය ඉදිරියට    ගෙන
සුවසෙත ඇවැසිනම් කවුරුත් හිතට    ගෙන
තම පරිසරය පිරිසිදු කර තබනු    මැන

06. විසි කොට ටින් කැබලි වත්තේ තැනින්    තැන
තිබුණොත් මදුරුවෝ පසුවෙත් ලැගුම්    ගෙන
හානිය ඉමහත්ය පෙදෙසට එයින්    වන
පසුවෙමු පරිසරය පිළිබඳ හොඳින්    දැන

07. කෑම පාර්සලයේ එතූ බත්    කොළය
මායිම් නොකොට විසි කරලා දමයි    එය
සිවුපා සතුන් සහ අපගේ    පරිසරය
වැනසෙන්නේය එය සිහියට ගත    යුතුය

08. රෝ බිය නිම කර ගැනුමේ    අවසරය
පිරිසිදුකමයි එය කාටත්    හිතකරය
සැනසුම ලබන්නට පළවා    හිරිහැරය
පිරිසිදු කරමු අපි අපගේ    පරිසරය

දුමින්ද ඩී. ප්‍රැන්සිස්කු (උප පොලිස් පරීක්ෂක)
ස්ථානාධිපති
පොලිස් විශේෂ කාර්යාංශය
පොලිස් ස්ථානය
ගම්පහ.